යම්කිසි ප්‍රවෘත්තියක් ජනමාධ්‍යයක් තුළ පළ කිරීමට පෙරාතුව, එය සියයට සියයක්ම නිවැරදි දැයි තහවුරු කර ගැනීමට උපරිම සාධාරණ උත්සාහයක් ගැනීම ජනමාධ්‍යවේදියකුගේ වගකීමක් වේ. මෙය ඉටු නො වූ අවස්ථාවකට උදාහරණයක් ලෙසින් පහත දැක්වෙන දිවයින පුවත පෙන්වා දිය හැක. මෙහි 'ස්විස් තානාපතිට ගෙදර යන්න වෙයි' යන හෙඩිමෙන්, රජයේ ආරංචි මාර්ග මූලාශ්‍ර ලෙස උපුටා දක්වමින් පුවතක් පළ කොට ඇත.

කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් නැගුණු විමසීම් වලට පිළිතුරු දෙමින් ස්විස් විදේශ කටයුතු පිළිබඳ ෆෙඩරල් දෙපාර්තමේන්තුව මගින් දක්වා තිබුණේ එම තොරතුරු නිරවද්‍ය නොවන බවත්, ශ්‍රී ලංකාවේ ස්විස් තානාපතිවරයා මේ වන විටත් ඔහුගේ රාජකාරි ඉටු කරමින් සිටින බවත් වේ.

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
මූලාශ්‍ර සඳහා පිවිසෙන්න:- https://twitter.com/SwissMFA/status/1204783662723739650
https://twitter.com/SwissMFA/status/1204783061214388224
https://twitter.com/SwissMFA/status/1204782905551204352

#MediaEthicsSL #SinhalaPress #lka #Divaina